සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 15 S I

නම: ..............................................

# ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය දෙකයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) කානා නුවර සරණ මංගල්‍ය සඳහන් වන ශුභාරංචි ග්‍රන්ථය වන්නේ,
1. මතෙව් ශුභාරංචි ය. 2. මාක් ශුභාරංචි ය. 3. ලූක් ශුභාරංචි ය. 4. ජොහන් ශුභාරංචි ය.

02) කිතුනු සභාව වෙනුවෙන් තම ජීවිතය පූජා කළ වේද සාක්ෂිකයා වන්නේ,
1. පේදුරු ය. 2. ස්තේපන් ය. 3. පිලිප්තුමා ය. 4. සාවුල් ය.

03) මුවදෙන යන අර්ථය ඇති නාමය වන්නේ,
1. ප්‍රිස්කිලා ය. 2. මාර්තා ය. 3. තබීතා ය. 4. ලිදියා ය.

04) ස්තේපන් තුමා තුළ තිබු යහපත් ගුණාංගයක් නොවන්නේ,
1. ශුද්ධාත්මයෙන් පූර්ණව ක්‍රියා කිරීම. 2. ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම.
3. වාසි බලාපොරොත්තුවෙන් ක්‍රියා කිරීම. 4. ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම.

05) කිතුනු සභාව වැනසීමට කැපවීමෙන් කටයුතු කළ ජුදෙව් නායකයා වන්නේ,
1. සාවුල් ය. 2. ස්තේපන් ය. 3. පිලිප් ය. 4. පේදුරු ය.

06) "ස්වාමීන් වහන්සේ මාගේ එඬේරාණෝය අඟ හිඟ මට නොවන්නේ ය" මෙම පාඨයෙන් සිහිපත් කරවන සත්‍යතාව වන්නේ,
1. දෙවිඳුන් අපේ සරණ හා ශක්තිය බව ය. 2. දෙවිඳුන් අපේ දිව්‍ය පෝතකයානන් බව ය.
3. මුළු කල්පනාව දෙවිඳුන් තුළ තබා ඇති බව ය. 4. දෙවිඳුන් අපේ ප්‍රේමයේ පියාණෝ බව ය.

07) "ඔබ මට වඩා දැහැමියි" යැයි සාවුල් පැවසුවේ,
1. පේදුරුට ය. 2. ස්තේපන්ට ය. 3. සලමොන්ට ය. 4. දාවිත්ට ය.

08) දෑත් එක්ව තබාගෙන යාච්ඤා කිරීමෙන් පෙන්නුම් කරන්නේ,
1. දෙවිඳුන් අපට සමීපව වැඩ වසන බව ය. 2. දෙවිඳුන්ට මුළුමනින්ම යටත්වන බව ය.
3. මුළු හදවතින්ම සමිඳුන් සමඟ එක්වන බවය. 4. දෙවිඳුන් හා එකඟතාවයක් ඇති බව ය.

09) ස්වාමීන් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාව,
1. ආත්මාර්ථකාමී යාච්ඤාවකි. 2. පරාර්ථකාමී යාච්ඤාවකි.
3. මැදහත් යාච්ඤාවකි. 4. උත්තම පූජක යාච්ඤාවකි.

10) දෙවියන් වහන්සේ ඉදිරියේ නිවැරදි හා යහපත් දේ කුමක්දැයි අවබෝධ කර ගැනීමට හැකි වන්නේ,
1. දේව වචනය මැනවින් හැදෑරීමෙනි. 2. යහපත් මිතුරන් ඇසුරු කිරීමෙනි.
3. යහපත් පොතපත කියවීමෙනි. 4. දෙමාපිය උපදෙස් පිළිපැදීමෙනි.

11) කපර්ණවුම නම් ගමේදී ජේසුස් වහන්සේ විසින් සුව කළ රෝගියා වන්නේ,
1. ලාදුරු රෝගියා ය. 2. අතක් පණ නැති රෝගියා ය.
3. රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා ය. 4. අංශභාග රෝගියා ය.

12) අප ක්‍රිස්තුස් වහන්සේ මෙන් තම කම බැහැර කළ යුත්තේ,
1. අපගේ විමුක්තිය වෙනුවෙනි. 2. අන් අයගේ විමුක්තිය වෙනුවෙනි.
3. අපගේ සහ අන් අයගේ විමුක්තිය වෙනුවෙනි. 4. යහපත් මිනිසුන්ගේ විමුක්තිය වෙනුවෙනි.

13) සබත් දින සුවකරනු ලැබූ රෝගියා හා සුදර්ශන දොරටුව අසල සුව කරනු ලැබූ රෝගියා වූයේ,
1. මී මැස්මොර රෝගියා හා ලාදුරු රෝගියා ය.
2. අතක් පණ නැති මිනිසා හා කොර රෝගියා ය.
3. අතක් පණ නැති මිනිසා හා මී මැසිමොර රෝගියා ය.
4. ලාදුරු රෝගියා හා කොර රෝගියා ය.

14) මුල්කිතුනු සභාවේ සහනාධාර බෙදා දීම සඳහා පත්කළ නියෝජිතයින් ගණන තෝරන්න,
1. හතකි.
2. හයකි.
3. දහයකි.
4. දොළහකි.

15) "ඔවුහු ද කා තෘප්තියට පැමිණියාහ. ඉතිරි වූ කැබලි එක්කොට කූඩා හතක් පුරවාගත්හ" මෙම ශුද්ධ ලියවිලි පාඨය හා සම්බන්ධ සිදුවීම කුමක් ද?
1. පන්දහසකට කෑම දීම ය.
2. අන්තිම රාත්‍රී භෝජනයේදී ය.
3. කානා නුවර සරණ මංගල්‍යදී ය.
4. හාරදහසකට කෑම දීම ය.

16) ජේසුස් වහන්සේගේ උත්ථානය මගින් පුනර්ජීවනය ඇති වන බව ප්‍රේරිතයන් විසින් ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු උදහසට පත් නොවූයේ කවුරුන් ද?
1. පූජකයින්.
2. ප්‍රජා මූලිකයන්.
3. අයකැමියන්.
4. සද්දුසිවරුන්.

17) දාවිත් රජු පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න,
1. මෙපිබෝශෙත් ට කරුණාව දැක්විය.
2. එන්ගෙයෙහිදි සාවුල්ගේ ජීවිතය මුදා හැරීම.
3. සාවුල්ට පෙර ඉශ්‍රායෙල් හි රජ බවට පත් විය.
4. දෙවියන් වහන්සේට ගරු බිය ඇතිව ජීවත් වීම

18) A - පරාර්ථකාමීත්වය B - යසස්භාවය C - විවාදය
ඉහත වරණ අතරින් මාංසික තෘෂ්ණා සඳහන් පිළිතුර වන්නේ,
1. A හා C ය.
2. B හා C ය.
3. A හා B ය.
4. A,B හා C ය.

19) දේව වචනයට අනුව ජීවත් වන අප,
1. අයුක්තිය වෙනුවෙන් පෙනී සිටිය යුතුය.
2. සූදුව සම්පූර්ණයෙන් වැළඳ ගත යුතුය.
3. මුදල් ඉපැයීම සඳහා අනියම් ක්‍රියා කළ යුතුය.
4. අයුතු කෙටිකාලීන ලාභ අපේක්ෂා නොකළ යුතුය.

20) නව යොවුන් වියේ සිටින ඔබ සෑම විටම,
1. දේව කැමැත්තට ඉඩ දිය යුතුය .
2. ඔබ කැමති දේ කළ යුතුය .
3. මිතුරන් කැමති දේ කළ යුතුය.
4. සමාජයට කැමති දේ කළ යුතුය.

(ල.2x20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) කෙටි පිළිතුරු සපයන්න.
i. ශු. පාවුල් තුමා විසින් රචනා කරන ලද ලිපි 02 ක් සඳහන් කරන්න.
ii. "ඔබේ ......................... මාගේ දෙපයට පහනක්ය. මාගේ ......................... එළියත් ය. මෙහි හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.
iii. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 2 ක් නම් කරන්න.
iv. "ස්වාමින් වහන්සේගේ යාච්ඤාවේ" සමාව සම්බන්ධ පදය ලියා දක්වන්න.
v. මුල් කිතුනු සභාවට පීඩා එල්ල කළ ජන කණ්ඩායම් 02 ක් නම් කරන්න.
vi. "ඔබගේ ශරීරය ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය" ලෙස පාවුල් තුමා දක්වා ඇත්තේ කුමන බයිබල් ග්‍රන්ථයේ ද?
vii. පවුලේ අයහපත් හැසිරීම් රටා නිසා අත්විඳීමට සිදුවන ගැටළු 02 ක් නම් කරන්න.
viii.තරඟකාරි සමාජයේ මිනිසා තමන් පිළිබඳව අධිතක්සේරුවෙන් සිතන කරුණු 02 ක් ලියන්න.

(ල.2x8=16)

02) i. එදිනෙදා ජීවිතයේ අපට මුහුණ දීමට සිදුවන ව්‍යසන 02 ක් නම් කරන්න.
ii. පීඩා හමුවේ දිවිගෙවන ඔබට දෙවිඳුන් පිහිට වන ආකාර 03 ක් ලියන්න.
iii. දෙවිඳුන්ගේ සරණ හා ශක්තිය ලැබූ කිතුනු ඔබ අන් අයගේ ජීවිත ගොඩනැංවීමට ක්‍රියා කරන ආකාර 06 ක් ලියන්න.

(ල.2+3+6=11)

03) i. දෙවියන් වහන්සේ මිනිසා වෙත අනාවරණය වන ප්‍රබලම මාර්ගය කුමක් ද?
ii. දේව වචනය අවබෝධ කර ගැනීමට ඔබට මඟපෙන්වන පුද්ගලයින් 03 දෙනෙකු නම් කරන්න.
iii. අදුරෙන් මිදී ඔබේ ජීවිතය ආලෝකමත් කර ගැනීමට දේව වචනයෙන් ලැබෙන මඟපෙන්වීම් 06 ක් ලියන්න.
(ල.2 +3+6 =11)

04) i. පෙන්තකොස්ත දින සිදුවූ විශේෂ සිදුවීම කුමක් ද?
ii. එම සිදුවීමෙන් පසු ශ්‍රාවකයන් කළ බලවත් ක්‍රියා 03 ක් ලියා දක්වන්න.
iii. කිතුනු දරුවෙකු ලෙස ශුභාරංචිය අන් අය වෙත ගෙන යාමට ඔබට කළ හැකි දේවල් 06 ක් ලියන්න.
(ල.2+3+6 =11)

05) i. කිතුනුවා සන්නාහ සන්නද්ධ විය යුතු යුධ ආයුධ 02 නම් කරන්න.
ii. වත්මන් සමාජයේ නපුරු බලවේග ඔබ වෙත එන ආකාර 03 ක් ලියන්න.
iii. කිතුනු සෙබළෙකු සතුවිය යුතු යාච්ඤාව පිළිබඳ කරුණු 03 ක් ලියන්න. (ල.2 +3+6 =11)

06) i. පහත බයිබල් පාඨය සම්පූර්ණ කරන්න.
"ස්වාමින් වහන්සේ මාගේ .................................... අගහිඟ මට .............................. ය.
ii. පැරණි ගිවිසුමේ දෙවිඳුන් දිව්‍ය පෝෂකයාණන් ලෙස ක්‍රියා කල අවස්ථා 03 ක් ලියන්න.
iii. මම හාරදහසකට කෑම දීමේ සිදුවීමට සම්බන්ධ වූවකු යැයි සිතා එම සිදුවීම ඔබේ වචනයෙන් ලියන්න.
(ල.2+3+6=11)